www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බැංකු සහ සමාජවාදය

## The banks and socialism

2010 ජනවාරි 14

මහා අවපාතයෙන් මෙපිට සමයෙහි හට ගත් දැවැන්තතම ආර්ථික සහ සාමාජික අර්බුදය මධ්‍යයේ ප්‍රධාන එක්සත් ජනපද බැංකු සිය ඉහල පෙලේ විධායකයන්ට සහ ගනුදෙනුකරුවන්ට ඩොලර් මිලියන සංඛ්‍යාතයක වසර අවසාන ප්‍රසාද දීමනා ගෙවීමක් නිවේදනය කරන්නට යයි. සමපේක්ෂන ප්‍රයෝග හරහා අර්බුදය වේගවත් කල "මූල්‍ය මායාකාරයන්" ගලවා ගැනීම සඳහා ඇප වන්නට ම ක්‍රියාවට නැංවුනු භාන්ඩාගාර කොල්ලය නිසා, දැන් බැංකුකරුවන්ට පෞද්ගලික ධනය ගොඩ ගසා ගැනීම හඹා යන සිය උමතු සහගත ගමන මුලු ජවයෙන් යුතුව යලි පටන් ගත හැකි ය.

මෙය වනාහි ගෝලීය ප්‍රපංචයකි. ලෝක ධනවාදයේ ප්‍රධාන මධ්‍යස්ථාන සියල්ලෙහි ම මූල්‍ය ප්‍රභූ පිරිස්, ආර්ථික ගරා වැටීම තුලින් වඩා ශක්තිමත්වත් පෙර කිසි කලෙකටත් වඩා බලසම්පන්නවත් මතුව එමින් ද පෞද්ගලික ධනය ගොඩ ගසා ගැනීම සඳහා යන තම ගමනේ කොන්දේසිවලට අනුව ක්‍රියා කරන ලෙස දීන ආන්ඩුවලට අන කරමින් ද සිටිති.

එක්සත් ජනපදයේ ගෝල්ඩ්මන් සැක්ස් බැංකුව එකතුව වශයෙන් ගත් විට ඩොලර් බිලියන 20කට වැඩි ප්‍රසාද දීමනාවක් ප්‍රකාශයට පත් කරනු ඇතැයි අපේක්ෂිත ය. මෙය කැලිෆෝනියා රාජ්‍යයේ අයවැය හිඟයට සමාන ය. එක් විශ්ලේෂකයෙකු තක්සේරු කරන පරිදි, ගෝල්ඩ්මන් ප්‍රසාද දීමනාවේ සාමාන්‍යය ඩොලර් 600,000කට ලං වේ; සමහර විධායකයන්ට ඩොලර් මිලියන 10කට වැඩියෙන් ගෙදර ගෙන යා හැකි ය. 2009 විධායක පාරිතෝෂික ප්‍රදානයේ දී, ගෝල්ඩ්මන් සැක්ස්, බැන්ක් ඔෆ් ඇමරිකා, සිටිබැන්ක්, ජේ.පී. මෝර්ගන් චේස් සහ මෝර්ගන් ස්ටැන්ලි යන බැංකු එකට ගත් විට ඩොලර් බිලියන 90ක් මුදා හරිනු ඇතැයි අපේක්ෂිත ය. මින් අඩකටත් වඩා ගෙවන්නට යන්නේ ප්‍රසාද දීමනාවල ස්වරූපයෙනි.

අබල වත්කම් සහන වැඩ සටහන (ටීඒආර්පී) යටතේ අරමුදල් ලබා ගත් බැංකු 20 මත අධිබද්දක් පනවන යෝජනාවක් ජනාධිපති ඔබාමා බ්‍රහස්පතින්දා එනම් අද දින නිවේදනය කිරීමට නියමිත ය. මෙය කල් තබා මහජන ප්‍රතිරෝධය වෙනතකට යොමු කිරීම සහ මැඩ ලීම සඳහා දරන ඉතා පැහැදිලි ප්‍රයත්නයකි. පාලනාධිකාරය කියන පරිදි, මෙයින් ඉදිරි වසර දහයේ දී ඩොලර් බිලියන 120ක් උපදිනු ඇත. කෙසේ වතුදු, මෙය විශාලතම බැංකු පහ 2009 වසර සඳහා සිය විධායකයන්ට ගෙවන්නට යන මුදලට වඩා බෙහෙවින් වැඩි මුදලක් නම් නො වේ.

අධිබදු යෝජනාව පැමිනෙන්නේ මහජන සම්බන්ධතා පිලිබඳ තවත් ප්‍රෝඩාවක් සමග ය. එනම්, බැංකුකරුවන්ගේ සාපරාධී ක්‍රියාවන්ට සුදු හුනු ගෑමේ අරමුනෙන් අටවන ලද බල රහිත මන්ඩලයක් වන මූල්‍ය අර්බුද විමර්ශන කොමිසම මෙම සතියේ පැවැත්වූ විභාගය යි. "ඔබාමාගේ මෘදු බැංකු බද්දේ" නිශ්චිත තොරතුරු විස්තර මොනවා වුවත්, *වෝල් ස්ට්‍රීට් ජර්නල්* පුවත්පත වැඩ පිලිවෙල හඳුන්වන පරිදි නම් එය වෝල් වීදියට කිසිදු සැලකිය යුතු දන්ඩනයක් පනවනු නැති බව නිසැකව කිව හැකි ය. තමන් විධිමත් කිරීමට අරමුනු කර ගෙන සිටින බැංකු ම මැතිවරන උද්ඝෝෂන සඳහා දෙන ආධාර මුදල් ද වෙනත් අල්ලස් ද මත රැඳී සිටින දේශපාලනඥයන්ගෙන් සමන්විත කොන්ග්‍රසයක් පවතින තතු යටතේ සිදු වනු ඇත්තේ අනදාල තත්ත්වයට පත් වන තුරු යෝජනාවට බාධා කිරීම හෝ යෝජනාව දියාරු කිරීම පමනකි. වැටුප් සීමා කිරීම, බැංකු කටයුතු විධිමත් කිරීමේ පිරිවැඩියාව, නයවර පත් "පිලිසකර කිරීම" සහ ඔබාමාගේ ඊනියා නිවාස බේරා ගැනීම යන බෙහෙවින් වග වර්නනා කෙරෙන යෝජනාවලට අත් වන ඉරනම එබඳු ය.

නොවැදගත් සාමාන්‍ය මිනිහෙකු ලබන වැටුපට වඩා සිය ගුනයකටත් වැඩි වැටුප් ලැබීමට තමන්ට ඇති අයිතිය ස්වල්ප ම ස්වල්ප වශයෙන් පැහැර ගැනීමකට පවා වෝල් වීදියේ අධිපතියන් දක්වන ප්‍රතිචාරය කෝපයෙන් ඇවිලුනක් වනු ඇත.

ප්‍රන්ස විප්ලවයට පෙර ප්‍රන්සයේ තිබුනු පාලන තන්ත්‍රයෙහි සිටි පුයර උලා බොරු කොන්ඩවලින් සැරසී ගත් රදලයන්ට බෙහෙවින් සමානව මෙම නූතන කාලයේ වංශාධිපතියන් සහ ආර්යාවෝ ද අසීමිත පෞද්ගලික ධනය ගොඩ ගසා ගැනීමට තමන්ට පවතින අයිතිය අනභියෝගී යැයි අවධාරනය කරති. "මේ මිනිස්සුන්ගේ නොනවතින හෙලා දැකීම් නිසා මම

ටිකක් වෙහෙසට පත් වෙල යි ඉන්නෙ," කෝපයට පත් ජේ.පී. මෝර්ගන් බැංකු ප්‍රධාන විධායක නිලධාරියෙකු වන ජැමී ඩිමොන් ප්‍රසාද දීමනා ගැන හට ගෙන තිබෙන මහා කලබැගෑනිය පිලිබඳව මෙම සතියේ කියා සිටියේ ය. "උන් නිකම් ම නිකම් කන් කෙඳිරි ගානව ය කියලා මම හිතන්නෙ නැහැ ... මේ මිනිස්සු ලඟ නීත්‍යනුකූල ද්‍රවශීලතා නිකුතු තියෙනවා," නම සඳහන් නොකල තවත් විධායකයෙක් බැංකුකරුවන්ගේ විරෝධය පෑම් ගැන පැවසී ය.

කිසිදු වටිනාකමක් නූපදන මිනිස්සු සිටිති. වඩා මුල් කාල පරිච්ඡේදයක සිටි, සිය අතිවිශාල ධන සම්භාරය දැවැන්ත කාර්මික අධිරාජ්‍යයන් ගොඩ නැගීමත් සමග බැඳී පැවති, කානෙගී, රොකෆෙලර්, එඩිසන් සහ ෆෝර්ඩ් වැනි නම්වලින් හැඳින්වුනු කර්මාන්තයේ කප්පිත්තන් මෙන් නො ව, අද දින සිටින පල් හොර වංශාධිපතියන් සිය වාසනාව පාදා ගෙන ඇත්තේ කර්මාන්තය විනාශ කිරීම ද කම්කරු පන්තියේ ජීවන තත්ත්වයන් මත එල්ල කල නිර්දය ප්‍රහාරයක් ද සමග බැඳී ගත් පරපුටු මූල්‍ය මෙහෙයුම් හරහා ය.

පෙරවරනය කිරීම් වේගයෙන් ඉහල නගින සහ සාගින්න සහ දරිද්‍රතාව වැඩෙන තතු මධ්‍යයේ මූල්‍ය ප්‍රභූව සිය ධනය පුරසාරම් දොඩයි. "ගනුදෙනුකරුවන් සහ ආයෝජන බැංකුකරුවන් වැටුප් පිලිබඳ සමෘද්ධිමත් සමයක් සේ පෙනී යන දෙයක හමාර රේඛාව සමීපයෙහි සිටිද්දී, සමහරු කිසි දවසක මූල්‍ය අර්බුදයක් ඇති නොවුනා සේ මුදල් වියපැහැදම් කරමින් සිටිති" යි *වෝල් ස්ට්‍රීට් ජර්නල්* පුවත්පත මෑතක දී වාර්තා කලේ ය.

"කැරිබියන් සමාගමේ සිතුවම් වෙන්දේසි සතියකට ඩොලර් 15,000කින් සෝදාපාලු වී යාමේ සිට ප්ලැටිනම් අත් ඔරලෝසු අලෙවිය ඩොලර් 200,000කින් අතු ගෑවී යාම දක්වා ... සොඳුරු ජීවිතයේ මහඟු සලකුනු පෙරලා එමින් පවතී." නිව් යෝකයෙහි වෙසෙන ප්‍රභූ නිශ්චල දේපොල තැරැව්කාරයෝ ප්‍රසාද දීමනා පිලිබඳ ප්‍රශ්නය මත "මුලුමනින් ම තෝන්තු වී සිටිති." මන්ද, ප්‍රසාද දීමනා නිසා, "විශේෂයෙන් ම ඩොලර් මිලියන 2 සිට ඩොලර් මිලියන 5 දක්වා පරාසයේ විකුනුම් ඉහල යනු" ඇත.

බැංකුකරුවන් නිසා එක්සත් ජනපද සහ ලෝක ආර්ථිකය බිඳ වැටීමේ ආසන්නයට ම ගොස් වසරකට වැඩි කාලයක් ගත වී තිබිය දීත් මූල්‍ය පද්ධතිය ප්‍රතිසංස්කරනය කිරීම සඳහා තව මත් කිසි දෙයක් කර නැත. වගකිව යුතු යැයි කිසිවෙකු නම් කර ද නැත. ඒ වෙනුවට සිදු වී ඇත්තේ, බැංකු කිසි දා නො ඉපයූ තරම් මුදලක් උපයා ගැනීම සඳහා තමන් ම නිර්මානය කල අර්බුදය ගසා කෑමත් ආන්ඩුව, උසාවි සහ මාධ්‍ය තමන් මූල්‍ය ප්‍රභූවක් යැයි නිශ්චිතව ම නම් කල හැකි දෙයක නිකම් ම නිකම් මෙහෙකාරියන් පිරිසක් පමනක් බව එලිදරව් කර ගැනීමත් පමනකි.

මෙයින් පෙන්නුම් කෙරෙන්නේ, ඉතා කුඩා ප්‍රභුවක අත ධනය සංකේන්ද්‍රනය වීම සහ ඔවුන් පෞද්ගලික ධනය ගොඩ ගසා ගැනීමේ අරමුන පසු පස අසීමිතව හඹා යාම යනු ඒවා එසේ නො වී නම් තාර්කික සහ හිතකර වන පද්ධතියක් නිකම් ම නිකම් පමන ඉක්මවා යාමක් හෝ නොමග යාමක් නොවන බව යි. ධනවාදය නොන්ඩි ගසමින් 21 වන සියවසට පා තබද්දී එහි ආවේනික ස්වභාවය තුල ම මෙම ලක්ෂන මුල් බැස ගෙන පවත්නේ ය.

එය එක්සත් ජනපද සහ ගෝලීය බැංකු පද්ධතිය "පිලිසකර කිරීම" පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. සමාජයේ ධනය මත බැංකු ප්‍රභූව පවත්වා ගෙන යන මාරක ග්‍රහනය කුඩු පට්ටම් කල යුතු ය. මූල්‍ය ප්‍රභූව කරන සමාජය කොල්ල කෑමට පිලිතුර වන්නේ බැංකුකරුවන්ගේ වත්කම් අත්පත් කර ගෙන, බැංකු සහ මූල්‍ය ව්‍යාපාර ජනසතු කොට, වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ ඒවා රජයේ භාරකාර අරමුදල් බවට පරිවර්තනය කිරීම යි.

බැංකුකරුවන්ගේ දුර්දාන්ත පාලනයට පවතින විකල්පය නම් සමාජවාදය යි. එනම්, බැංකුවල සහ ප්‍රධාන කර්මාන්තවල පෞද්ගලික අයිතිය අහෝසි කිරීම සහ තාර්කික සැලසුම්කරනයෙන් සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයෙන් ධනපති වෙලඳ පොල පෞද්ගලික ලාභය නො ව සාමාජික අවශ්‍යතාව අනුව සීරුමාරු වන වෙලඳ පොලකින් විස්ථාපනය කිරීම යි.

බැංකුවල ගනන් හිලව් පොත් මහජන පරීක්ෂාව සඳහා විවෘත කල යුතු ය, සියලු කොල්ලකාර සහ නීති විරෝධී ක්‍රියාකාරකම්වලට එරෙහිව නීතිමය පියවර ගත යුතු ය. මූල්‍ය ප්‍රභූව අයුතු ලෙස උපදවා ගත් ධනය අත්පත් කොට ගෙන, සෞඛ්‍ය රැකවරනය, අධ්‍යාපනය, නිවාස, රැකියා යන දැවෙන සාමාජික අවශ්‍යතා සපුරා ලීම සඳහා ඒවා යොදා ගත යුතු ය.

මෙය එක්සත් ජනපදය තුල සහ ජාත්‍යන්තරව කම්කරු පන්තිය ස්වාධීනව දේශපාලනිකව බලමුලු ගැන්වීමේත් - එනම් ඔබාමා පාලනාධිකාරයට සහ එක්සත් ජනපද මහ ව්‍යාපාරික පක්ෂ දෙකට එරෙහි අරගලයක් - සහ කම්කරු ආන්ඩුවක් ගොඩ නැගීමේත් අවශ්‍යතාව මතු කරයි.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ සහ සමාජවාදී සමානතා පක්ෂයේ ක්‍රියා මාර්ගය එය යි.*

ටොම් එලී

© www.wsws.org